# දිනීමට නම්

අද සිංහලයන් දෙමළ ජාතිවාදය පිළිබඳ එක මතයක නොමැති බව පැහැදිලිය. ඇතැමකුට අනුව අප රටේ ඇත්තේ ජනවාර්ගික ප්‍රශ්නයකි. ඇතැම්හු ත්‍රස්තවාදී ප්‍රශ්නයක් ගැන කතාකරති. තවත් සමහරු දෙමළ ජනතාවට ඇති ප්‍රශ්න ගැන කතා කරති. රාජ්‍ය නොවන සංවිධානවල බැල මෙහෙකම් කරන්නෝද සිංහලයන් ලෙස පෙනී සිටිති. ඔවුන් පෙන්වීමට තැත්කරන්නේ ඔවුන්ගේ ඊනියා සාධාරණභාවයය. එහෙත් ඔවුහු විළියක් බියක් නැතිවම තම දෙමළ ජාතිවාදී බව පෙන්වති. ඔවුහු එය දෙමළ ජාතිවාදය ලෙස නොහඳුනති. සිංහලයන්ගෙන් විශාල පිරිසක් දෙමළ ජාතිවාදය යන වචනය යොදාගැනීමට අකමැති වෙති. එහෙත් දෙමළ ජනයාගේ තත්ත්වය කුමක්ද? ඔවුන්ගෙන් බහුතරයේ මතය දෙමළ ජනයාට මෙරට අසාධාරණයක් වන බවය. ඒ අතර ඔවුන්ගෙන් ඇතැමෙක් දෙමළ අභිලාෂ ගැන කතා කරති. ඒ කුමක් වුවත් ඔවුන්ගේ ඊනියා ප්‍රශ්නයට ඔවුන් දෙන පිළිතුර නම් බලය බෙදිය යුතු බවය. මෙහිදී ඔවුන් බලය යනුවෙන් හඳුන්වන්නේ ව්‍යවස්ථාදායක බලය බව රහසක් නොවේ. එසේම බලය බෙදීමද කළයුත්තේ බ්‍රිතාන්‍යයන් විසින් අවසන් වරට 1889 දී බෙදා වෙන්කරන ලද පළාත් සීමා පදනම් කරගෙන යැයි ඔවුහු කියාසිටිති. ඔවුන්ගෙන් ඇතැමකුට අනුව එවැනි බලය බෙදීමකදී උතුර හා නැගෙනහිර පළාත් එක්කළ යුතුය. එහෙත් නැගෙනහිර පළාතේ වෙසෙන දෙමළ ජනතාව ඒ පළාත් වෙන්කළ යුතුය යන අදහස දරණ බව පෙනෙයි.

දෙමළ ජනයා ඊනියා ප්‍රශ්නය හඳුනාගන්නා අන්දම පිළිබඳ එතරම් වෙනස් මත නොදරණ නමුත් සිංහලයන් විවිධ මත දරණ බව කලින් සඳහන් කෙරී ඇත. එලෙසම ඊනියා විසඳුම් සම්බන්ධයෙන්ද එවැනි වෙනස්කම් දැකිය හැකිය. රාජ්‍ය නොවන සංවිධානවල බැල මෙහෙකම් කරන්නෝ, ආසියාවේ පමණක් නොව අප්‍රිකාවේ ද ආණ්ඩු පෙරළීමට බටහිරයන්ගේ අවශ්‍යතාව සඳහා බටහිරයන්ගේ මුදලින් වැඩකරන තැනැත්තකු නොවන්නට මේ වන විටත් වසා දමා ඇති පත්තර කඩමාල්ලක කුලියට ලියන්නෝ බලය බෙදිය යුතුය යන ස්ථාවරයේ පිහිටති. ඔවුන්ගේ ස්ථාවරය දෙමළ ජාතිවාදී වෙයි. ඒ අතර අද ඇත්තේ ත්‍රස්තවාදී ප්‍රශ්නයක් යැයි කියමින් හමුදා මෙහෙයුම්වලින් කොටි පරාජයකිරීමට කටයුතු කළ යුතු යැයි කියන්නෝද වෙති. එහෙත් ඔවුන්ට පිළිතුරු ලෙස කලින් කී බැලයන් ප්‍රකාශකරන්නේ දෙමළ ජනයාගේ ඊනියා ප්‍රශ්නවලට සිංහලයන්ගෙන් විසඳුම් ලැබී නැති බැවින් දෙමළ ජනයාට ත්‍රස්තවාදී ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට බලකෙරී ඇති බවය. අප කලින් සතියක ද පෙන්වා දී ඇති පරිදි ත්‍රස්තවාදය යනු ප්‍රශ්නයකට වඩා දෙමළ ජාතිවාදය විසින් ජය ලැබීම වස්, එනම් බලය බෙදීම සාර්ථක කරගනු වස් යොදගන්නා ක්‍රමවේදයකි. ඒ හේතුව නිසාමත් ත්‍රස්තවාදය ප්‍රශ්නයක් බවත් එය පරාජය කළයුතු බවත් පවසන්නෝද වෙති. ත්‍රස්තවාදය ප්‍රශ්නයක් වී ඇති බව පැහැදිලිය. එහෙත් ඒ මූලික ප්‍රශ්නය නොවෙයි. මූලික ප්‍රශ්නය දෙමළ ජාතිවාදයය. එහෙත් දෙමළ ජාතිවාදය යන වචන දෙක උච්චාරණය කිරීමටත් අකමැති අය වෙති. ඒ ඔවුන්ගේ සිහි කල්පනාවට බටහිරයන් ආදේශ වී ඇති බැවිනි. එයට ආවේශ වී ඇතැයි කීමද වරදක් ඇතැයි මම නොසිතමි.

අප යේදී ඇත්තේ කිනම් කරතව්‍යයකදැයි නොදන්නෝ වෙති. දයානිති හෙවත් දයා මාර්ටර් කොළඹට පැමිණ අසනීපය සුවකරගෙන ආපසු ගියේය. මෙහිදී ජනාධිපතිතුමාට කවුරුන් උපදෙස් දුන්නේ දැයි අපි නොදනිමු. ඒ කෙසේ වෙතත් ආණ්ඩුව දයාවක් නැති දයා මාස්ටර්ට කිලිනොච්චියේ සිට කොළඹට පැමිනීමට ගුවන් යානා පහසුකම්ද රෝහල් පහසුකම්ද ලබා දුන්නේය. දයා මාස්ටර් සනීප වී ආපසු ගියේය. එහෙත් ඔහු ආපසු යාපනයට ගියේ දයාවක් ඇති කරගෙන නොවෙයි. දයා මාස්ටර් ආපසු යෑමෙන් පසුව කොටි සිංහලයන් මැරීම නවතා දමා නැත. ඔහු සනීපකිරීමෙන් සිංහලයාට වූ යහපත කුමක්ද? ඇතැමුන් සිතන්නේ දයා මාස්ටර්ට සුවය අත්කරදීමෙන් ආණ්ඩුව කොටින්ට කනේ පහරක් දුන් බවය. එය මුළුමනින්ම වැරදිය. ම්ලේච්ඡයන් වූ කොටින්ට දයා මාස්ටර් සුවකිරීම පාඩමක් නොවෙයි. අනෙක් අතට ඒ ක්‍රියාවෙන් ඊනියා ලෝක ප්‍රජාව ඉදිරියේ අපට හොඳ නමක් අත්වන්නේද නැත. ඉන් ජනාධිපතිතුමාට ලකුණු ලැබේ යැයි කීවද එයද නොසිදුවෙයි. එයට හේතුව ඊනියා ලෝක ප්‍රජාව ප්‍රසිද්ධියේ කුමක් කීවත් දයා මාස්ටර්ට පහසුකම් සැපයීම හුදු බාල දේශපාලන ක්‍රියාවක් ලෙස ඔවුන් සලකන බැවිනි. සතුරාට වුව ද සැලකීම කෙතරම් හොඳ ක්‍රියාවක්දැයි අසන ඕල්කට් බෞද්ධයන්ද ඇති බව අපි දනිමු. ප්‍රභාකරන්ටද අසනීප වුවහොත් ආණ්ඩුව ඔහුට ඉතා දැඩි ආරක්ෂාවක් සපයා කොළඹ රෝහලකට ඇතුළත් කරන්නේද? දයා මාස්ටර්ගේ බිරිය ආණ්ඩුවෙන් උපකාර ඉල්ලා ඇත. ඇය සිංහලයන් නොමරන ලෙස දයා මාස්ටර්ගෙන් ඉල්ලා ඇත්ද? ඉල්ලුවත් දයා මාස්ටර් එයට කන් දෙන්නේද? කොටි සිංහලයන්ට එරෙහිව සටන් කරති. එහිදී ආණ්ඩුව බැලිය යුත්තේ යම් ක්‍රියාවකින් රාජ්‍යයට වන යහපත කුමක්ද? කොටින්ට අත්වන වාසිය කුමක්ද? ආදී කරුණු පමණය. දයා මාස්ටර් සුව

© Prof. Nalin De Silva

වී ආපසු යෑමෙන් වාසියක් අත්වන්නේ කොටින්ට පමණය. දෙමළ ජාතිවාදියකුට පෞද්ගලිකව දයාව පෑමට ජනාධිපතිතුමාට අයිතියක් නැත. මේ පෞද්ගලික කරුණක් නොව රාජ්‍යය හා කොටි අතර ප්‍රශ්නයකි. රාජ්‍යය හා සතුරන් අතර ප්‍රශ්නවලදී කටයුතු කළ යුත්තේ පෞද්ගලික දයාව කරුණාව පින් පව් සලකමින් නොවන බව ගැමුණු කුමරු අපට කියා දී ඇත. ජාතියේ වාසනාවට ගැමුණු කුමරු ඕල්කට් බෞද්ධයෙක් නොවීය.

මේ සියල්ලට හේතුව ප්‍රශ්නය තේරුම් නොගැනීමය. මෙය දෙමළ ජාතිවාදය පිළිබඳ ප්‍රශ්නයකි. පසුගිය සතියේ එක්තරා දර්ශන මහාචාර්යවරයකු පුවත්පතකට ප්‍රකාශකර තිබුණේ මා දැන් දෙමළ ජනයාට දෙමළ වීම නිසාම ප්‍රශ්නයක් ඇති බව පිළිගන්නා බවය. ඔහු එසේ කියන්නේ අපටම ආවේණික ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා පත්කර ඇති කමිටුවක මා ද දේශපාලන පක්ෂයක් නියෝජනය කරන බැවිනි. ඒ කමිටුවෙන් කෙරෙන්නේ මෙරට ඇති ප්‍රශ්නයට පිළියමක් ලෙස දේශීය ව්‍යවස්ථාවක් සකස්කර ගැනීමය. දෙමළ ජනයාට දෙමළවීම නිසාම ප්‍රශ්නයක් නැති බව එකකි. මෙරට ප්‍රශ්නයක් ඇති බව තවත් එකකි. මේ මහාචාර්යවරයාට තමන් දර්ශනය ඉගෙන ගත්තද ඉගැන්නුවද, මේ වෙනස නොතේරෙයි. ඔහුට සියුම් මනසක් නැති බව පැහැදිලිය. මෙරට ප්‍රශ්නයක් නැතැයි මා කිසිදාක කියා නැත. මෙරට ප්‍රශ්නයක් ඇත. ඒ ප්‍රශ්නය ලන්දේසීන් හා බ්‍රිතාන්‍යයන් ඇතිකළ එකකි. ඔවුහු අද ඒ ප්‍රශ්නය තවදුරටත් ඉදිරියට ගෙන යති. ප්‍රශ්නය සිංහලයාට, සිංහල භාෂාවට, සිංහල සංස්කෘතියට මෙරට හිමිවිය යුතු තැන අහිමි කිරීමය. එසේ අහිමිකිරීමට දෙමළ ජාතිවාදය යොදාගනු ලැබේ. යම්කිසි ජාතියකට, ජනවර්ගයකට, ගෝත්‍රයකට හිමිවිය යුතු දෑ අහිමිකිරීම ජාතිවාදයය. අද මේ රටේ ඇත්තේ දෙමළ ජාතිවාදයකි. එහෙත් ඇංකර් මහාචාර්යවරු, රාජ්‍ය නොවන සංවිධානවල තකතීරු උගත්තු, ඊනියා ප්‍රබුද්ධයෝ සහ තවත් එවැන්නෝ තම ස්වාමිවරුන් වූ බටහිරයන් වෙනුවෙන් මෙරට සිංහල ජාතිවාදයක් ඇති බවට බොරු කතා ප්‍රචාරය කරති. එහෙත් දෙමළ ජනයාට දෙමළ වීම නිසාම අහිමි වී ඇත්තේ කුමක් දැයි ඇසූ කළ නිහඬ වෙති.

සිංහලයන් ප්‍රශ්නය තේරුම්ගෙන නැත. අපේ මූලික ප්‍රශ්නය ද එයය. ප්‍රශ්නය තේරුම් නොගෙන ප්‍රශ්නයක් විසඳන්නේ කෙසේද? ලෝකයේ කිසිම රටක බහු සංස්කෘතික සමාජයක් නැත. ඉතිහාසයක් නැති සිංගප්පූරුවේ පවා චීන සංස්කෘතික විශේෂයක් ප්‍රධාන සංස්කෘතිය වෙයි. රටක ඇති සියලු සංස්කෘතීන්ට සමානව සලකන රට කුමක්ද? බහු සංස්කෘතික බහුබූතය යුදෙව් ක්‍රිස්තියානි නොවන සංස්කෘතීන් පාගාදැමීමට බටහිර බුද්ධිමතුන් ඇතිකරගෙන ඇති ව්‍යාජයක් පමණය. මා පුන පුනා පෙන්වා දී ඇත්තේ බ්‍රිතාන්‍යයේ ප්‍රධාන සංස්කෘතිය ඉංගිරිසි ඇංග්ලිකන් සංස්කෘතිය බවය. එරට දැනුම, නීතිය සිරිත් විරිත් ආදී සියල්ල තීරණයවන්නේ ඒ සංස්කෘතියෙහි මිස මුස්ලිම්, යුදෙව් හින්දු හෝ චීන සංස්කෘතියක නොවෙයි. එහිදී බෞද්ධ සංස්කෘතියක් ගැන කතා කිරීමෙන් වැඩක් නැත. එහි වැඩවසන භික්ෂූන් වහන්සේට ඇතැම් විට එලිසබෙත් වින්ඩ්සර් මහත්මිය නම්බුනාම ප්‍රදානය කරයි. ඒ අවස්ථාවට භික්ෂූන් වහන්සේ ඇය ඉදිරියේ හිටගෙන සිටිය යුතුය. එය සුළු කරුණක් යැයි ඇතැමකුට පෙනී යා හැකිය. මහා කරුණුවලදී ද බ්‍රිතාන්‍යයේ කටයුතු සිදුවන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියට අනුරූපව නොවේ. ලංකාවේ සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකිරීමට බටහිරයෝ තමන් විසින් නිර්මාණය කෙරුණු දෙමළ ජාතිවාදය යොදාගනිති. යම් අයුරකින් ඔවුන් ජයගතහොත් ඔවුන් තම තුවක්කු හරවනු ඇත්තේ දෙමළ හින්දු සංස්කෘතිය වෙතටය. අවුරුදු පන්සීයකට වැඩි කලක් මුළුල්ලේ බටහිරයන් විසින් සිංහලයන්ට, සිංහල භාෂාවට, සිංහල සංස්කෘතියට අහිමිකරනු ලැබූ දේ දිනාගැනීමට සිංහලයන්ට සිදු වී ඇත. පනස්හය ඒ අහිමිකරනු ලැබූ දේ දිනාගැනීමේ ක්‍රියාවලියේ දුර්වල අවස්ථාවක් පමණකි. අද මෙරට සිංහල ජාතිවාදය, සිංහල අධිපතිවාදය ආදී වශයෙන් හැඳින්වෙන්නේ බ්‍රිතාන්‍යයන් ඇතැම් දෙමළ වෙල්ලාල පිරිසකට දුන් විශේෂ වරප්‍රසාද සුළුවෙන් නැතිකිරීමය. යටත්විජිතවාදීන් දුන් විශේෂ වරප්‍රසාද නැතිකිරීම යටත්විජිතවාදයට ද එරෙහි වූ සටනක් මිස සිංහල ජාතිවාදයක් නොවේ. අද මාක්ස්වාදීන්ද සිංහල ජාතිවාදයක් ගැන කතා කරන්නේ මාක්ස්වාදයේ සංස්කෘතික යටත්විජිතවාදය හෙළිදරවු කරමිනි. අද සිංහලයන්ට තම අයිතිවාසිකම් දිනාගැනීමේ මානසිකත්වයක් නැත. බටහිරයන් ඊනියා සිංහල ජාතිවාදයක් ගැන කියමින් සිංහලයන් මානසිකව දුර්වල කර ඇත. අප මේ තත්ත්වයෙන් ගොඩ ආ යුතුය. අද අප සටන් කරන්නේ පරාජය වැළැක්වීමට මිස ජයගැනීමට නොවේ. සිංහලයන්ගේ යටත් විජිත විරෝධී සටන අවසන් නැත. සිංහලයන්ට දිනාගැනීමට නැති වී ගිය අයිතිවාසිකම් රාශියක් වෙයි. දිනිය හැක්කේ එකාවන්ව ප්‍රශ්නය තේරුම්ගැනීමෙන් හා දිනන මනසක් ඇතිකර ගැනීමෙනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva